# 12. ජේසු බිළිඳා නමදිමු

ගෙදර සැම දෙනා ම එක් එක් වැඩවල යෙදිලා. තාත්තා ගේ පිරිසිදු කරනවා.

අම්මා රස කැවිලි හදනවා. අක්කා ඇඳුම් මහනවා.

අමරත් නයනාත් එකතු වෙලා ගවලෙනක් හදනවා.

සැවො ම නත්තල සමරන්න සූදානම් වන්නේ හරි ම උනන්දුවකින්.

අමර : තාත්තේ අද අපට නත්තල් කතාව කියා දෙන්න කෝ.

තාත්තා : හා ඔයාලා කැමති ද ඒක අහන්න.

ළමයි : ඔව් ඔව්

තාත්තා : ඔන්න එහෙනම් අහගන්නකෝ.

නත්තල් දවස කියන්නේ ජේසු බිළිඳා ඉපදුණු දවසයි. ජේසු බිළිඳාගේ අම්මා වූ මරියතුමී හා තාත්තා වූ ජෝසප්තුමා දුර ගමනක් ගියා. ඒ ගියේ බෙත්ලෙහෙමටයි. ඒ ගමේ එදා බොහෝ සෙනඟ රැස් ව සිටියා. ඒ නිසා නවතින්න තැනක් හොයා ගන්න අමාරු වුණා. ඔවුන්ට ඉඩ ලැබුණේ කුඩා ගව මඩුවකයි. ජේසු බිළිඳා ඉපදුණේ එතැන දී. මව් මරියා, ජේසු බිළිඳාව රෙදිවලින් ඔතා ගව ඔරුවේ නිදි කෙරෙවුවා.

නයනා : ඉතින් තාත්තේ ගව මඩුවේ සතුන් සිටියේ නැද්ද?

තාත්තා : ඔව් බැටළුවන්, ගවයන් එහි ඉන්න ඇති. මේ අතර දේව දූතයෙක් බැටළුවන් බලාගත්තා එඬේරුන්ට, ජේසු බිළිඳා ඉපදුණු බව දැන් වූවා. ඔවුන් ඉතා ඉක්මනින් ජේසු බිළිඳා බැලීමට ආවා. මේ දුප්පත් එඬේරුන් දේව දූත පණිවිඩය අසා පුදුමයට පත් වුණා. ඔවුන් ගවලෙන වෙත ගමන් කළා. ජේසු බිළිඳා දැක ඉතා ප්‍රීති වුණා. ඔවුන් ආපසු යන විට මුණ ගැසුණු සැම දෙනාට ම දේව දූතයා කී පණිවිඩය දැන්වූවා.

අමර : හරිම ලස්සන කතාව. අපිත් ඒ කාලයේ හිටියා නම් ඒ පණිවිඩය අපටත් අසන්නට ලැබෙනවානේ.

තාත්තා : ඒ නිසා තමයි අදත් අපි නත්තල සමරන්නේ, ජේසු බිළිඳා නමදින්නේ.

## පැවරුම්

1. පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

   i ජේසුස් වහන්සේ ඉපදුණේ කොහේ ද ?

   ii බිළිඳු ජේසු බලන්න ආවේ කවු ද ?

   iii නත්තල් උත්සවයට ඔබ කරන දේ කියන්න.

2. නත්තල් උත්සවය සඳහා යැවෙන සුබ පැතුම් පතක් හෝ කුඩා තිළිණයක් සකසන්න.